ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය **II** කොටස

අවසාන පරීක්ෂණය 2006

පරිසර අධ්‍යයනය **- ESP 2472**

කාලය - පැය තුනයි (03)

---

දිනය : 2006.03.03 වේලාව : පෙ.ව.10.00 සිට ප.ව.01.00 දක්වා

---

ප්‍රශ්න <u>තුනකට *(03)* පමණක්</u> පිළිතුරු සපයන්න.
සෑම පිළිතුරක් සඳහාම වෙනම පොතක් භාවිතා කළ යුතුයි.

01. **(i)** ප්‍රාථමික පාසල් විෂය මාලාවට පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය ඇතුළත් කිරීමේ අරමුණු හඳුන්වා දෙන්න.

(ලකුණු 30)

**(ii)** ප්‍රාථමික පාසල් ශිෂ්‍යයාගේ සමස්ත සංවර්ධනය සඳහා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් දායක වන අයුරු කෙටියෙන් පැහැදිළි කරන්න.

(ලකුණු 30)

**(iii)** පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්, ප්‍රාථමික පාසල් පංති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමේදී විෂය සමගාමී ක්‍රියාකාරකම් හා සම්බන්ධ කෙරෙන අයුරු නිදසුන් ඇසුරින් පැහැදිළි කරන්න.

(ලකුණු 40)

02. **(i)** පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයෙහි සුවිශේෂ ලක්ෂණ හතරක් (04) පැහැදිළි කරන්න.

(ලකුණු 40)

**(ii)** ජාතික පොදු අධ්‍යාපන අරමුණු කරා එළඹීමට අවශ්‍ය පදනම සැකසීමට මූලික වන පොදු නිපුණතා අතරින්, සිසුන් තුළ ඇතිවේයැයි අපේක්ෂිත පරිසරයට අදාළ නිපුණතා කෙටියෙන් පැහැදිළි කරන්න.

(ලකුණු 30)

**(iii)** ප්‍රාථමික ශ්‍රේණිවල පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ 6 වන ශ්‍රේණියේ පරිසර අධ්‍යයනය යන විෂයය අන්තර්ගතයන්හි සම්බන්ධතාවය ගොඩනැගෙන අයුරු නිදසුනක් ඇසුරින් පහදා දෙන්න.

(ලකුණු 30)

03. **(i)** පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්, සිසුන් තුළ නිර්මාණී බව වර්ධනය කිරීමට උපකාරී වන්නක් ලෙස සැලකීමට හේතු පැහැදිළි කරන්න.

(ලකුණු 30)

**(ii)** සිසුන් තුළ නිර්මාණී චින්තනය වර්ධනය කිරීමට උපකාරී වන ක්‍රම 4 ක් නම් කර, ඉන් එකක් පංති කාමරය තුළ ක්‍රියාත්මක කළ හැකි අයුරු සුදුසු නිදසුනක් ඇසුරෙන් පැහැදිළි කරන්න.

(ලකුණු 40)

**(iii)** සිසුන් තුළ නිර්මාණී බව සංවර්ධනය කිරීමේදී ගුරුවරයාගේ භූමිකාව කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 30)



016

04. (i) ගුරු පුහුණුව අවසන් කරන ගුරුවරයෙකු තුළ සංවර්ධනය වේ යැයි අපේක්ෂා කෙරෙන නිපුණතා අතරින් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය හා අදාළ වන නිපුණතා 4 ක් පැහැදිළි කරන්න.

(ලකුණු 40)

(ii) ඉහත නිපුණතා ඇති කිරීම සඳහා ගුරු අධ්‍යාපන වැඩ සටහනකදී අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙතක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 30)

(iii) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ප්‍රාථමික පංති කාමරයේ ක්‍රියාත්මක කිරීමේදී ගුරුවරයෙකු මුහුණපාන ගැටළු දක්වා, ඒවා මගහරවා ගැනීමට විසඳුම් යෝජනා කරන්න.

(ලකුණු 30)

05. (i) "පරිසරයෙන් ඉගෙනුම"
"පරිසරය පිළිබඳව ඉගෙනුම"
"පරිසරය උදෙසා ඉගෙනුම" යන සංකල්ප පැහැදිළි කරන්න.

(ලකුණු 30)

(ii) තෝරාගත් තේමාවක් ඇසුරෙන්, "පරිසරය උදෙසා ඉගෙනුම" යටතේ සිසුන්හට ලබාදිය හැකි ඉගෙනුම් අත්දැකීම් මාලාවක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 30)

(iii) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයෙහි "සමෝධානිතබව" සහ "සම්බන්ධීකරණ කාර්යය" සුදුසු නිදසුන් ඇසුරෙන් පහදා දෙන්න.

(ලකුණු 40)

06. පහත දැක්වෙන ඕනෑම කරුණු තුනක් (03) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා සුදුසු ඇගයීම් හා තක්සේරු කරන ක්‍රමවිධි.

(ii) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ අංගයක් ලෙස සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය

(iii) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා බැඳුණු සෞන්දර්යය අධ්‍යාපන මූලික නිපුණතා

(iv) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයමාලාවේ ඇති සමාජ අධ්‍යයනය සංකල්ප

(ලකුණු 33 1/3 බැගින්)

\- හිමිකම් ඇවිරිණි. -